පොදු චක්‍රලේඛ ලිපි අංක : 02-91-2012(1)

මගේ අංකය :- ටීඒ/06/01/2013(ආ.හා.ඖ.ප)
සෞඛ්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය",
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ-10.
2013.05. 21

සියලුම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් වරුන්,
සියලුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
රේඛීය අමාත්‍යාංශය යටතේ ඇති විශේෂිත ව්‍යාපාර ප්‍රධානීන් හා ආයතන ප්‍රධානීන් වෙත,

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආහාර හා ඖෂධ පරීක්ෂකවරුන් බඳවා ගැනීම.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ 2012.06.15 දිනැති පොදු චක්‍රලේඛ ලිපි අංක 02-91/2012 මගින් ආහාර හා ඖෂධ පරීක්ෂක පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවීම මෙම චක්‍රලේඛය මගින් අවලංගු කරනු ලැබේ.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආහාර හා ඖෂධ පරීක්ෂක පුරප්පාඩු සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති රේඛීය අමාත්‍යාංශය යටතේ හා පළාත් සභා යටතේ පාලනය වන සෞඛ්‍ය ආයතනවල සේවය කරන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. **සුදුසුකම්,**

I. වයස් සීමාව අදාළ නොවේ.

II. 2013..... දිනට II "අ" ඛණ්ඩයේ 6 වසරක සතුටුදායක සේවාවක් සම්පූර්ණ කරන ලද, නියමිත දෙපාර්තමේන්තු පරීක්ෂණ වලින් සමත් සේවයේ ස්ථිර කරන ලද නිලධාරීන් විය යුතුය.

III. රාජකීය සෞඛ්‍ය සංගමයේ (ලන්ඩන්) ඩිප්ලෝමා සහතිකය හෝ කළුතර ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ හෝ වෙනත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනුමත පුහුණු මධ්‍යස්ථානයකින් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු වශයෙන් ලබාගත් සහතිකය.

සහ

IV. රාජකීය සෞඛ්‍ය සංගමයේ (ලන්ඩන්) මස් හා වෙනත් ආහාර වර්ග පරීක්ෂා කිරීමේ නිපුණතා සහතිකය හෝ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන තෙවැයි මාසික ආහාර හා ඖෂධ පරීක්ෂා පිළිබඳ පාඨමාලාව සාර්ථක ලෙස හදාරා ලබාගත් සහතිකය.

සැ.යු. :-

මධ්‍යම රජයට අයත් සෞඛ්‍ය ආයතනවල දැනට සේවය කරන ඉහත දක්වා ඇති මූලික සුදුසුකම් සපුරා ඇති මහජන සෞඛ්‍ය පරීක්ෂක නිළධාරීන්ට බඳවා ගැනීමේදී ප්‍රමුඛතාවය හිමිවේ.
(මෙම තනතුර සඳහා රා.ප.ව. 06/2006/(MT 5 2006) ට අනුව මාසිකව රු.21180-360×17-27300 ක වැටුප් පරිමාණයක් අදාල වේ.)

02. මෙය ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් වන අතර වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය.

03. අවශ්‍ය සුදුසුකම් ඇති අයදුම්කරුවන් තරඟ විභාගයක් මඟින් රා.ප.චක්‍රලේඛ අංක 15/90 හි විධිවිධාන පරිදි බඳවාගනු ලැබේ.

04. ආයතන සංග්‍රහයේ දෙවන පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා වගන්ති වලට පත්වීම අදාල වනු ඇති අතර එක් අවුරුදු සේවා පරිවාස කාලයකට යටත් වේ.

05. තෝරාගත් අයදුම්කරුවන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ රාජකාරි කටයුතු ආවරණය කිරීම සඳහා යොදවනු ලැබේ.

06. 1980 අංක 27 දරණ විලවුන්, උපකරණ හා ඖෂධ පනත යටතේ බලයලත් නිලධාරියෙකුගේ කාර්යය ඉටු කිරීම, විලවුන්, උපකරණ හා ඖෂධ නිෂ්පාදනාගාරවල යහපත් නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳ පරීක්ෂා කිරීම සහ ඒ පිළිබඳ සුදුසු ක්‍රියාමාර්ගයන් ගැනීම, ඖෂධවේදීන් ඖෂධ ශාලා හිමියන් වැනි ඖෂධ ක්ෂේත්‍රයේ නිලධාරීන් පුහුණු කිරීම, දිවයිනේ අනෙකුත් පරිපාලන ක්ෂේත්‍රයන්හි විලවුන්, උපකරණ හා ඖෂධ පනත ක්‍රියාත්මක කිරීමේ කටයුතු මෙහෙයවීම හා අධීක්ෂණය කිරීම, සියලුම විලවුන්, උපකරණ හා ඖෂධ අනුකමිටු වලට සහභාගී වීම හා එම කමිටු තීරණ පිළිබඳ පියවර ගැනීම ආදී කටයුතු මෙම අංශයේ ඇතැම් ප්‍රධාන කාර්යයන් වේ.

07. මේ සඳහා ඉල්ලුම් කිරීමට කැමති හා ඉහත සුදුසුකම් ඇති මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්/ඔවුන්ගේ විස්තර මේ සමඟ ඇති අයදුම් පතට අනුව සකස්කර 2013..... දිනට පෙර ආයතන ප්‍රධානීන් මඟින් පහත ලිපිනයට ඉදිරිපත් කරන ලෙස උපදෙස් දෙන්න. අයදුම්පත එවන ලිපි කවරයේ වම් කෙලවරේ (ආහාර හා ඖෂධ පරීක්ෂක නිලධාරීන් තෝරා ගැනීම) යනුවෙන් සඳහන් කළ යුතුය.

අධ්‍යක්ෂ (පාලන) 02,
සෞඛ්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය",
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ-10.

වෛද්‍ය වයි.ඩී. නිහාල් ජයතිලක,
සෞඛ්‍ය ලේකම්.

පිටපත්:- 01. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ම.සෞ.සේ.)ට- දැ.පි.

වෛද්‍ය වයි. ඩී. නිහාල් ජයතිලක
ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.